# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල
# மாவட்ட செயலாளர் அலுவலகம் - காலி
# DISTRICT SECRETARIAT - GALLE

අංක 06, කොළඹ පාර, ගාල්ල இல 06, கொழும்பு வீதி, காலி No. 06, Colombo Road, Galle

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 091-2222233<br>091-2234491 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 091-2222972<br>091-2234236 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>E-mail | disecgl@sltnet.lk | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Web site | www.galle.dist.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | DSG/EST/19/01/2019 (පොදු) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020. 12. 15 |

ගාල්ල දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත,

**<u>උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන 2020 යටතේ බඳවාගත් අභ්‍යාසලාභීන් පුහුණුව සඳහා රාජ්‍ය අංශයට අනුයුක්ත කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GT/2020 – 1 දරණ 2020. 12. 11 දිනැති ලිපි හා බැදේ. (ඇමුණුම 01 හා 02)

02. ලිපිය පරිදි අදියරගත ලෙස උපාධිධාරි අභ්‍යාසලාභීන්හට පුහුණුව ලබාදීම 2020. 09. 14 දින ආරම්භ වූ අතර එහි පළමු අදියර නිමවීමෙන් පසු කොවිඩ් වසංගත තත්ත්වය මත දෙවන අදියර පුහුණුව ආරම්භ කිරීමට නොහැකිව ඇති බවත්, දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින උපාධිධාරී අභ්‍යාසලාභීන් සේවා අවශ්‍යතා ද පදනම් කරගෙන කාර්යාලවල පුහුණුව සඳහා කැඳවීමට දැනටමත් කටයුතු කර ඇති බවත්, දැනට එලෙස කාර්යාලවල පුහුණුව සඳහා යොදවා නොමැති අභ්‍යාසලාභීන් ද අවශ්‍යතාවය පදනම්කරගෙන ඇමුණුමෙහි සඳහන් කරුණු ද සැලකිල්ලට ලක්කරමින් පුහුණුව සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙසත්, දන්වා ඇත.

03. පදිංචි ප්‍රදේශයට ආසන්න රාජ්‍ය ආයතනයක පුහුණු අවස්ථාවන් සැලසිය යුතු වන අතර මේවනවිටත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ අවශ්‍යතාවයන් දන්වමින් රාජ්‍ය ආයතනවලින් ලැබී ඇති ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය දක්වා කටයුතු කරන ලෙසත්, ඔබගේ කොට්ඨාසයට අයත් රජයේ ආයතනවල අවශ්‍යතාවයන් ලබාගෙන, ඇමුණුමේ සඳහන් කරුණු පිළිබඳව සැලකිල්ලට ලක්කරමින්, සුදුසු පරිදි ඔබගේ කාර්යාලයට අනුයුක්තව සිටින උපාධිධාරී අභ්‍යාසලාභීන් රජයේ ආයතන සඳහා අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. අවශ්‍ය කටයුතු සඳහා අදාළ ලිපි මේ සමඟ අමුණා එවමි.

සෝමරත්න විදානපතිරණ,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය

සෝමරත්න විදානපතිරණ
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
ගාල්ල පරපාලන දිස්ත්‍රික්කය

පිටපත් :

1. ප්‍රධාන ගණකාධිකාරි - කරු. දැ.ගැ. ස.
2. අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) - කරු. දැ.ගැ. ස.